# ඔබේ හයිබ්‍රිඩ් වාහනයේ

## නඩත්තුවට වැදගත්වන කාර්මික අලුත්වැඩියාවන්



නුගේගොඩ - උඩහමුල්ල Sterling Aftercare මධ්‍යස්ථානය

**හයිබ්‍රිඩ් වාහන හිමිකරුවෙක් වශයෙන් ඔබ, ඔබගේ වාහනය පිළිබඳව සහ නියමිත කලට සිදුකළ යුතු අලුත්වැඩියාවන් පිළිබඳව දැනුවත්ද? ඒ දැනුවත්භාවය අවම වශයෙන් පවතින වාහන හිමියන් සඳහායි. මේ ලිපියෙන් ආමන්ත්‍රණය කරන්නේ. දශකයකට ආසන්න කාලයක් පුරා වාහන සේවා සැපයුම් ක්ෂෙත්‍රය හා බැඳි කීර්තිමත් නාමයක් වන ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගමේ සහකාර සාමාන්‍යාධිකාරී (කාර්මික) මලින්ද සෝමසිරි මහතා සමඟ ඒ පිළිබඳව සිදුකළ සාකච්ඡාවක් පහතින් දිගහැරේ.**



නාරාහේන්පිට Sterling Aftercare මධ්‍යස්ථානය

**වාහනයක හිමිකරුවෙක් තම වාහනයේ නඩත්තු කටයුතු සහ කාර්මික අලුත්වැඩියාවන් පිළිබඳව දැනගත යුතු මූලික කරුණු මොනවාද?**

සාමාන්‍යයෙන් ඕනෑම වාහන හිමිකරුවෙක්හට තමන්ගේ වාහනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇති දැනුවත්භාවයම වාහනයේ නඩත්තු කටයුතු සහ කාර්මික අලුත්වැඩියාවන් සම්බන්ධයෙනුත් පැවතිය යුතුයි. ඒ දැනුවත්භාවය වාහන වර්ගය අනුව වෙනස් වෙනවා. වෙළඳපොළට හඳුන්වා දෙන අලුත් වාහන මාදිලි පිළිබඳව කතාකරන විට ඒ ඒ වාහන සඳහා යොදාගෙන ඇති ඉලෙක්ට්‍රොනික තාක්ෂණය විවිධයි. වාහනවල කාර්මික පසුබිමට සාපේක්ෂව යොදා ඇති නව ඉලෙක්ට්‍රොනික පද්ධති, උපාංග සහ ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුම බොහෝ වාහන හිමිකරුවන්ට නැහැ. නමුත් මේ ඉලෙක්ට්‍රොනික පද්ධති මඟින් වාහනයේ සමස්ත ක්‍රියාකාරීත්වයට විශාල බලපෑමක් සිදු වෙනවා. විශේෂයෙන්ම වාහනයේ ඇතිවන විවිධ කාර්මික දෝෂ සඳහාත් මේ ඉලෙක්ට්‍රොනික පද්ධතිවල ක්‍රියාකාරීත්වය හේතු වෙනවා. ඒ නිසා වාහන හිමිකරුවෙක් තමන් පාවිච්චි කරන වාහනයේ පවතින අලුත් ඉලෙක්ට්‍රොනික පද්ධති මොනවාද? ඒ ඒ ඉලෙක්ට්‍රොනික පද්ධති මඟින් වාහනයේ ක්‍රියාකාරීත්වයට සිදු කරන බලපෑම, වාහනයේ දෝෂ ඇතිවූ විට ඊට බලපාන හේතු ආදී කරුණු පිළිබඳව දැනුවත් විය යුතුයි. ඒ පිළිබඳව නොදැනුවත් වාහන හිමිකරුවන්ව Sterling Aftercare සේවා මධ්‍යස්ථාන වලදී දැනුවත් කිරීමට අපි පියවර ගන්නවා.

ඕනෑම වාහනයක් මිලදී ගැනීමේදී පාරිභෝගිකයන් සඳහා අත්පොතක් (User Manual) හිමි වෙනවා. වාහනයේ කාර්මික කටයුතු ඇතුළුව සියලුම කරුණු එහි අන්තර්ගත වෙනවා. ජපානයේ නිෂ්පාදිත වාහනවල අත්පොත් නිකුත් කරන්නේ ජපන් භාෂාවෙන්. එවන් වාහන හිමිකරුවන්ට අපගේ මධ්‍යස්ථානවලට පැමිණ වාහනයේ නඩත්තුව පිළිබඳව ඔබ දැනගත යුතු සියලු කරුණු පිළිබඳව දැනුවත්වන්නට පුළුවන්.

**හයිබ්‍රිඩ් වාහන හිමිකරුවෙක් තම වාහනයේ නඩත්තු කටයුතු පිළිබඳ අත්‍යවශ්‍යයෙන්ම දැනගත යුතු කරුණු මොනවාද?**

වර්තමානය වනවිට වෙළඳපොළේ බහුල වශයෙන්ම පවතින්නේ සහ භාවිතයේ තිබෙන්නේ හයිබ්‍රිඩ් වාහනයි. වෙනත් වාහන සමඟ සසඳන විට හයිබ්‍රිඩ් බැටරිය සහ හයිබ්‍රිඩ් පද්ධති නිසා හයිබ්‍රිඩ් වාහන අනෙකුත් වාහනවලින් විශේෂ වෙනවා. ඒ වෙනස පිළිබඳව වාහන හිමිකරු මූලික වශයෙන් දැනගත යුතුයි. හයිබ්‍රිඩ් පද්ධති ආශ්‍රිතව වාහනයේ හටගන්නා දෝෂ සහ ඒ සඳහා සිදුකළ යුතු අලුත්වැඩියාවන් පිළිබඳව Sterling Aftercare මධ්‍යස්ථානවලට පිවිසීමෙන්ද දැනුවත් වන්නට පුළුවන්.



මහර - කඩවත Sterling Aftercare මධ්‍යස්ථානය

**Sterling Aftercare Centre වාහන හිමිකරුවන් සඳහා ලබා දෙන කාර්මික අලුත්වැඩියා ආශ්‍රිත සේවා මොනවාද?**

Sterling Aftercare මධ්‍යස්ථාන ඔස්සේ නොයෙකුත් වාහන මාදිලි සඳහා සේවා ලබා ගැනීමට වාහන හිමිකරුවන් පැමිණෙනවා. ඒ නිසා සියලුම වාහන හිමියන්ට අවශ්‍ය පූර්ණ සේවා සහ කාර්මික අලුත්වැඩියාවන් සිදුකිරීමට පහසුකම් දැනට අප සතුව තිබෙනවා. විශේෂයෙන්ම සියලුම මාදිලිවල ජපන් වාහන සඳහා OEMS canners අප සතුයි. මේ Scanners ඔස්සේ වාහන හිමිකරුවන්ට තම වාහනයේ දෝෂය නිවැරැදිව හඳුනා ගැනීමටත් ඒ සඳහා සිදුකළ යුතු කාර්මික අලුත්වැඩියාව නිවැරැදිව සිදු කර ගැනීමටත් හැකියාව ලැබෙනවා. Sterling Aftercare මධ්‍යස්ථාන මහර කඩවත, උඩහමුල්ල නුගේගොඩ, දූනගහ මිනුවන්ගොඩ සහ ගාල්ල යන ප්‍රදේශයන්හි ස්ථාපිත කර තිබෙනවා. ඊට අමතරව ලිහිසි තෙල් සේවා ලබා ගැනීමට සහ ඔබේ වාහනයට අවශ්‍ය නියම ජපන් අමතර කොටස් සහ උපාංග (Original Spare Parts & Acessories) මිලදී ගැනීම සඳහා වෙන්වූ Sterling Aftercare මධ්‍යස්ථානයක් නාරාහේන්පිට පිහිටුවා තිබෙනවා. තවද රථවාහන අනතුරු නිසා බරපතල හානි සිදු වූ වාහන පවා නියම ප්‍රමිතියට යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය සියලු පහසුකම්වලින් අපගේ දූනගහ මිනුවන්ගොඩ Sterling Auto City සමන්විත වෙනවා.



ගාල්ල Sterling Aftercare මධ්‍යස්ථානය



දූනගහ - මිනුවන්ගොඩ Sterling Aftercare මධ්‍යස්ථානය

අපගේ සේවා මධ්‍යස්ථාන හරහා සිදුකරන සෑම අලුත්වැඩියාවක් හෝ නඩත්තු සේවාවක්ම සිදු කෙරෙන්නේ අදාළ වාහන මාදිලිවල ඒජන්තවරුන් (Agent) භාවිතා කරන දත්ත උපයෝගී කරගෙනයි. මෙසේ ඕනෑම වාහනයකට සේවා සැපයීමේදී ඒජන්තවරයා හා සමානවම සේවා සැපයිය හැකි සේවා සපයන්නන් අතළොස්ස අතර අප සිටින බව විශේෂයෙන් අප සඳහන් කළ යුතුයි.

**Sterling Aftercare Centre හි තාක්ෂණය පිළිබඳව සඳහන් කළොත්...**

අප සමාගම සතු තාක්ෂණය පිළිබඳ සඳහන් කරනවා නම් දැනට ලංකාවේ වාහන නඩත්තු කිරීම හා අලුත්වැඩියාව සම්බන්ධ නවීනතම තාක්ෂණය සහ ඊට අවශ්‍ය හොඳම අමුද්‍රව්‍ය, උපාංග අප සතුයි. Sterling Aftercare මධ්‍යස්ථානවල සේවයේ නියුතු සියලු තාක්ෂණික සහ කාර්මික ශිල්පීන් ජපන් තාක්ෂණික දැනුමින් සන්නද්ධයි. විශේෂයෙන්ම ඔවුන් ඒ හා සම්බන්ධ පළපුරුද්දෙන් සමන්විතයි. අපගේ ආයතනයේ මවු ශාඛාව ජපානයේ පිහිටා තිබෙන නිසා ජපානය සමඟ අප සමීප සම්බන්ධතාවක් පවත්වනවා. ජපන් තාක්ෂණික විශේෂඥයින්ගේ (Japanese Technical Experts) සහය නිරතුරුව අප සමාගම ලබා ගන්නේ පාරිභෝගිකයින්ට ගුණාත්මක, නවීන සහ යාවත්කාලීන වූ තාක්ෂණික සේවාවක් පිරිනැමීමේ අරමුණ ඇතිවයි.

**නියම ජපන් වාහන අමතර කොටස් Sterling Aftercare මධ්‍යස්ථානවලදී ලබා ගත හැකියි නේද?**

ඔව්. ඕනෑම Sterling Aftercare මධ්‍යස්ථානයක් ඔස්සේ ජපන් වාහන සඳහා අමතර කොටස් මිලදී ගැනීමේ හැකියාව පාරිභෝගිකයන් සඳහා අප උදා කර දී තිබෙනවා. Sterling Aftercare මධ්‍යස්ථාන සෘජුව Sterling Japan ආයතනය හා සම්බන්ධතා පවත්වන නිසා ජපන් වාහන සඳහා අවශ්‍ය නියම අමතර කොටස් ජපානයෙන් ආනයනය කර පාරිභෝගිකයන්ට ලබා දීමේ හැකියාවක් අපට තිබෙනවා. ඊට අමතරව නාරාහේන්පිට පිහිටුවා තිබෙන Sterling Aftercare මධ්‍යස්ථානය ඔස්සේ පාරිභෝගිකයන්ට අවශ්‍ය ජපන් වාහන අමතර කොටස් මිලදී ගන්නටත් පුළුවන්.

**අනෙකුත් වාහන සඳහා පවතින සේවා මධ්‍යස්ථාන හා සසඳන විට Sterling Aftercare Centre හි විශේෂත්වයන් මොනවාද?**

Sterling Aftercare Centre අපගේ වගකීම වන්නේ පාරිභෝගිකයින්ගේ වටිනා වාහනයට අවශ්‍ය සේවාවන් ගුණාත්මක අයුරින් පිරිනැමීමයි. Sterling Aftercare Centre හිදී ක්‍රමානුකූල සැලසුම් සහගත බවකින් යුතුව ඔබේ වාහනයට අවශ්‍ය සේවා ලබා දීමට අප කටයුතු කරනවා. අපගේ සේවා මධ්‍යස්ථාන වෙත පිවිසෙන පාරිභෝගිකයන් සඳහා සේවා උපදේශකවරුන් ඔස්සේ වාහනයට හිතකර සහ අහිතකර තත්ත්ව, වාහනයේ අමතර උපාංග, වාහනයේ නඩත්තුව, වාහන හිමිකරුවෙක් ලෙස ඔබ දැනගත යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳව දැනුවත්භාවය ලබා දීමට අප කටයුතු සම්පාදනය කර තිබෙනවා. අප වාහන මාදිලි ගණනාවක් සඳහා සේවා ලබා දෙන නිසා වාහන හිමිකරුවන්ට තම වාහනය Sterling Aftercare මධ්‍යස්ථාන වෙත යොමු කිරීමේ දී දෙවරක් සිතා බැලීමට අවශ්‍ය වන්නේ නැහැ. අප කෙරෙහි පාරිභෝගිකයන් තබා ඇති විශ්වාසයට කිසිදු අයුරකින් හානියක් සිදු නොවීමට අප වගබලා ගන්නවා.

**අවසාන වශයෙන් වාහන හිමිකරුවන්ට ලබා දෙන පණිවුඩය කුමක්ද?**

වාහනයක් පදවන්නෙක් ලෙස තම වාහනයේ නියමිත කලට සිදුවිය යුතු අලුත්වැඩියාවන් පිළිබඳව යම් තරමකින්වත් දැනුවත් වන්න. එසේම ඒ අලුත්වැඩියා සහ සේවා කටයුතු සිදු කර ගැනීමට වගකිවයුතු ආයතනයක් වෙත යොමු වන්න. ඒ ඒ කාලසීමාවන් වලදී සිදුකළ යුතු නඩත්තු කටයුතු මඟ නොහැර සිදු කිරීමෙන් උපරිම කාලයක් පුරාවට කිසිඳු ගැටලුවක් නැතිව වාහනය පාවිච්චි කිරීමේ හැකියාව පවතිනවා.

**හෂිනි ඉරේෂා ගුණවර්ධන**




කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2019 අගෝස්තු මස 22 වැනිදා බ්‍රහස්පතින්දා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී